1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

ISO/IEC 17021 QMS-001-01

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2026.07.14 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) – 01/2026

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වෙත.

<u>පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන/ උපමාන පාදක ප්‍රදාන යටතේ වන ඉදිකිරීම්වලට අදාළව පරිපාලන වියදම් දැරීම</u>

"පළාත් සභා විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සඳහා පරිපාලන වියදම් වෙන් කර ගැනීම" යන ශීර්ෂයෙන් යුතුව සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් අමතා ඇති, මුදල් කොමිෂන් සභා ලේකම්ගේ අංක FC/PDP/01/01/2026-II දරන 2026.03.17 දිනැති ලිපිය මඟින්, **පරිපාලන වියදම් වෙන් කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කොමිෂන් සභාව හා රජය විසින් ලබා දී ඇති පළාත් සභාවලට බලපැවැත්වෙන චක්‍රලේඛ හා මාර්ගෝපදේශවලට අනුකූලව හා පළාත් මූල්‍ය රීති තුළ කටයුතු කරන ලෙස** දැනුම් දී ඇති බැවින්, සංවර්ධන කටයුතු සඳහා වෙන් වන ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් කිසියම් හෝ ප්‍රතිශතයක් පරිපාලන වියදම් වශයෙන් වෙන් කළ නොහැකි බව දන්වමි.

02. එමෙන්ම, දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ සඳහා වෙන් වන පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන/ උපමාන පාදක ප්‍රදාන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන (මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා) සහ පළාත් සභාවේ ව්‍යවස්ථාපිත ආයතන මඟින් ක්‍රියාත්මක වන අවස්ථාවන්හි දී පරිපාලන වියදම් වෙන් කර ගැනීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් උද්ගතව ඇති බව ද නිරීක්ෂණය වී ඇත.

03. සංවර්ධන වැඩ සඳහා වෙන් වන පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන/ උපමාන පාදක ප්‍රදාන ප්‍රතිපාදනවලින් ඉදිකිරීම් හා අලුත්වැඩියා සඳහා පමණක් ඇස්තමේන්තු වටිනාකමින් 3% ක් පරිපාලන වියදම් ලෙස වෙන් කිරීමට තීරණය කළ බවත්, මිල දී ගැනීම් හෝ පුහුණු වැඩසටහන් වෙනුවෙන් පරිපාලන වියදම් වෙන් කළ නොහැකි බවත් මින් අවධාරණය කරන අතර, ඉදිකිරීම් හා අලුත්වැඩියා

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

සඳහා පරිපාලන වියදම් දැරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා පුනරාවර්තන වියදම් යටතේ අදාළ වැය ශීර්ෂ ඇතුළත 1409-4 වැය විෂයය යටතේ ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කළ යුතු බවත්, එවැනි අවස්ථාවල දී එම මුදලින් දැරිය හැකි වන්නේ පුනරාවර්තන ස්වභාවයේ වියදම් පමණක් බවත් දන්වමි.

04. පළාත් සභාවේ ආයතන සඳහා වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පුනරාවර්තන වියදම් සඳහා දැනටමත් ප්‍රතිපාදන සලසා දී ඇති අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන (මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා) සහ පළාත් සභාවේ ව්‍යවස්ථාපිත ආයතන මගින් ඉදිකිරීම් හා අලුත්වැඩියා වැඩ ක්‍රියාත්මක කරනු ලබයි නම්, ඊට අවශ්‍ය වන 3% ක පරිපාලන වියදම සඳහා වන ප්‍රතිපාදන පමණක් 2026 වර්ෂයේ සිට ඔබ අමාත්‍යාංශයේ වැය විෂයය 1409-4 යටතේ සලසා ගත යුතු බව ද දන්වමි.

05. ඒ අනුව, 2026 වර්ෂය සඳහා ඔබ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති යටතේ වන ඉදිකිරීම් හා අලුත්වැඩියා වැඩවලට අදාළ පුනරාවර්තන වියදම් වෙනුවෙන් ඉහත 04 ඡේදයේ සඳහන් වන ආයතන සඳහා ප්‍රතිපාදන ලබා දීමට අවශ්‍ය වන්නේ නම්, ඊට අදාළ පරිපාලන වියදම් ඇස්තමේන්තු කොට දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අයවැය දෙපාර්තමේන්තුව වෙත පරිපූරක ඇස්තමේන්තු ලෙස ඉදිරිපත් කිරීම මගින් ප්‍රතිපාදන සලසා ගත යුතුය.

**චන්දිම සී. මුහන්දිරම්ගේ**

ප්‍රධාන ලේකම්

දකුණු පළාත

**පිටපත් :** 1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත. : දැ.ගැ.ස.

2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. : දැ.ගැ.ස.

3. දකුණු පළාත් සභාවේ සියලුම ගණන් දීමේ නිලධාරීන් : දැ.ගැ.ස.

4. අධ්‍යක්ෂ (අයවැය), ප්‍රධාන ලේකම් කාර්යාලය. : අ.ක.ස.

දුරකථන - **091 - 4944007** ෆැක්ස් - **091 - 2232691** විද්‍යුත් තැපැල - **depoffinance7@gmail.com**